# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
**மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு**
**Ministry of Women, Child Affairs and Social Empowerment**


| | | |
|---|---|---|
| මගේ අංකය DSD/HO/03/ACC/08/Budget-2024<br>எனதுஇல<br>My No | ඔබේ අංකය<br>உமது இல<br>Your No | දිනය 2024.07.18<br>திகதி<br>Date |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන්/ගණකාධිකාරීවරුන්
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන්
සමෘද්ධි බැංකු පාලක මණ්ඩල/විධායක කමිටු සභාපතිවරුන්
සමෘද්ධි බැංකු කළමනාකරු/සමෘද්ධි බැංකු සමිති කළමනාකරුවන්

**2022 වර්ෂයේ සැප්තැම්බර්,ඔක්තෝබර් සහ නොවැම්බර් මාස සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය මත සිදු කළ සමෘද්ධි, වැඩිහිටි, ආබාධිත, වකුගඩු ගෙවීම් සම්බන්ධ විස්තරාත්මක වාර්තා ලබාගැනීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ අමතන ලද අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක: DSD/HO/IT/11/CRM හා 2024.07.02 දිනැති ලිපියට හා අංක: DSD/HO/IT/11/ADB දරණ 2024.07.16 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. ආසියානු සංවර්ධන බැංකුවෙහි විගණන අංශය විසින් උක්ත කාලසීමාවෙහි ගෙවීම් කරන ලද සියළු ප්‍රතිලාභීන්ගේ දත්ත ඇතුළත් මෘදු පිටපතක් ලබාදෙන ලෙස අවස්ථා කිහිපයකදී අප වෙත දැනුම් දී ඇත. එම සියළු අවස්ථාවන්හි එකී කාර්යය ඉටුකිරීමෙහි ප්‍රායෝගික දුෂ්කරතා සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කළ ද අදාල කේවල වාර්තා ලබාදීමට කටයුතු කළ යුතු බව ඔවුන් විසින් අවධාරණය කර ඇත. ඒ අනුව සවිස්තරාත්මක වාර්තා ඉදිරිපත් කිරීමට ඔවුන් විසින් ලබාදී ඇති අවසාන දිනය 2024.07.25 වේ.

03.ආසියානු සංවර්ධන බැංකුවෙහි විගණන නිලධාරීන් වෙත 2024.07.25 දිනට මෙම වාර්තා ඉදිරිපත් කිරීම අප විසින් අනිවාර්යයෙන් කළ යුතු කාර්යයක් වන අතර එදිනට අදාල තොරතුරු ලබාදීය නොහැකිවුව හොත් ගෙවීම් කිරීමට සම්බන්ධ වූ සියළු පාර්ශවයන් බලවත් අපහසුතාවයකට පත්විය හැකි අතරම ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන විශ්වාසනීයභාවයට ද එය බලපෑම් කරනු ඇත.

04. මෙම තත්වයන් පිළිබඳ සළකා බලා ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර වාර්තා සකස් කිරීමේ ක්‍රියාවලිය පසුවිපරම් කර තොරතුරු තාක්ෂණ අංශය විසින් ලබා දී ඇති උපදෙස් අනුව ප්‍රතිලාභී ගෙවීම් කිරීමට අදාල සියළුම වාර්තා 2024.07.19 දින හෝ එදිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් ඉතා කාරුණිකව ඉල්ලමි.ප්‍රධාන කාර්යාලයෙහි නම් කර ඇති නිලධාරීන් වෙත යොමු කරනු ලබන වාර්තාවන් හි පිටපතක් cigasho@gmail.com විද්‍යුත් ලිපිනය ඔස්සේ මා වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් ද වැඩිදුරටත් කාරුණිකව ඉල්ලමි.

05. ගෙවීම් කාර්යයන්හි දී මෙන්ම අදාල වියදම් වාර්තා ලබාදීමේ දී ද මහත් කැපවීමෙන් ඔබ දක්වන ලද සහයෝගය අගය කරන අතරම මෙම කාර්යයෙහි දී ද එවැනිම අවධානයක් යොමු කර කටයුතු කරනු අතැයි අපේක්ෂා කරමි.

එච්.ජී.එන්.ප්‍රදීප්
ප්‍රධාන ගණකාධිකාරී
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට


1වනඅදියර,4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி)<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011-** |